ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදනය අංක: HRC/P/i/S/10/07/26

## මාධ්‍ය නිවේදනය

## මීගමුව බන්ධනාගාරයේ ප්‍රචණ්ඩක්‍රියා සහ ඉන්පසුව අනෙකුත් බන්ධනාගාරවල සිදු වූ සිදුවීම් සම්බන්ධ විමර්ශනය පිළිබඳ මාධ්‍ය නිවේදනය

මීගමුව බන්ධනාගාරයේ මෑතකදී ඇති වූ ප්‍රචණ්ඩක්‍රියා සහ ඉන්පසුව අනෙකුත් බන්ධනාගාරවල සිදු වූ සිදුවීම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විමර්ශනයක් ආරම්භ කර ඇත. විමර්ශනයේ ප්‍රධාන අංශ අතරට පහත සඳහන් දෑ ඇතුළත් වේ:

1. මීගමුව බන්ධනාගාරයේ ප්‍රචණ්ඩක්‍රියා සහ රැඳවියන්ගේ සහ බන්ධනාගාර නිලධාරීන්ගේ මරණ සහ තුවාල වලට හේතු වූ පසුබිම් තත්ත්වයන්;
2. 2026 ජූලි 7 වන දින රාත්‍රී 8.30 ට පමණ පූර්ව දැනුම් දීමකින් තොරව රැඳවියන් පරික්ෂා කිරීමට වැලිකඩ බන්ධනාගාරය වෙත ගිය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා නිලධාරීන්ට පිවිසීම ප්‍රතික්ෂේප කිරීම;
3. මීගමුව බන්ධනාගාරයේ සිට වෙනත් බන්ධනාගාර වෙත මාරු කරන ලද රැඳවියන්ට වධහිංසා පැමිණවීම සහ වෙනත් ආකාරයේ අයුතු ලෙස සැලකීම පිළිබඳ චෝදනා සහ බන්ධනාගාර නිලධාරීන්ගේ භාරයේ සිටියදී එවැනි රැඳවියන් දෙදෙනෙකු මිය යාමට හේතු වූ කරුණු.

ඉහත සඳහන් කළ විමර්ශන කිසිවක් සම්බන්ධයෙන් කිසිදු නිගමනයකට එළඹ නොමැති බවත්, දැනට රැඳවියන්ගෙන් සහ නිලධාරීන්ගෙන් ප්‍රකාශ ඇතුළු සාක්ෂි රැස්කර ඒවා ඇගයීමට ලක් කරමින් සිටින බවත් **කොමිෂන් සභාව පැහැදිලි කිරීමට කැමැත්තක් දක්වයි.** මීගමුව බන්ධනාගාරයේ සිට රැඳවියන් මාරු කරන ලද බන්ධනාගාර වෙත කොමිෂන් සභාවේ නිලධාරීන් කල සංචාරයන්ගෙන් මතුවන මූලික සොයාගැනීම් දැනට කොමිෂන් සභාව විසින් සමාලෝචනය කරමින් පවතී. මෙම සංචාරවලදී, එම රැඳවියන් කිහිප දෙනෙකු තුවාල ලබා ඇති බව එකී නිලධාරීන්ම නිරීක්ෂණය කළ බවත්, එම රැඳවියන්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමට ප්‍රමාද වී ඇති බවත් කොමිෂන් සභාව සඳහන් කරයි. එවැනි සිරකරුවන්ට ප්‍රමාදයකින් තොරව වෛද්‍ය ප්‍රතිකාර ලබා දිය යුතු බව හා එවැනි ප්‍රතිකාර ලබා දීමේ ඕනෑම ක්‍රමානුකූල ප්‍රමාදයක් පළිගැනීමක් විය හැකි බවත් කොමිෂන් සභාව පෙන්වා දී ඇත.

බන්ධනාගාර වෙත බාධාවකින් තොරව කොමිෂන් සභා නිලධාරීන්ට ප්‍රවේශ වීම සම්බන්ධයෙන්, 2026 ජූලි 8 දිනැති බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රාජකාරි ආවරණය කරන) වෙත යවන ලද ලිපියෙන් ප්‍රකාශිත සිය ගැඹුරු කනස්සල්ල කොමිෂන් සභාව නැවත අවධාරණය කරයි. 2026 ජූලි 7 වන දින වැලිකඩ බන්ධනාගාරය තුළට කොමිෂන් සභා කාර්ය මණ්ඩලයට ප්‍රවේශ වීම ප්‍රතික්ෂේප කිරීම 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත උල්ලංඝනය කිරීමක් වන අතර, විශේෂයෙන් වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ අයුතු සැලකිලි පිළිබඳ චෝදනා පිළිබඳ තොරතුරු ලැබී ඇති විට, බන්ධනාගාරවල සුභසාධනය පිළිබඳව අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීමට කොමිෂන් සභාවට ඇති අධිකාරී බලය එම ක්‍රියාව මගින් දැඩි ලෙස අවතක්සේරු කිරීමකි. 2026 ජූලි 8 වන දින කොමිෂන් සභාවට බාධාවකින් තොරව ප්‍රවේශය ලබා දුන් නමුත්, 2026 ජූලි 7 වන දින තීරණාත්මක අවස්ථාවක ප්‍රවේශය ප්‍රතික්ෂේප කිරීම මගින් චෝදනා පිළිබඳව ඵලදායී හා අවශ්‍ය කාලරාමුව තුළ විමර්ශනය කිරීමේ අවස්ථාව අහිමි වී ඇත. වධහිංසා පැමිණවීම සහ වෙනත් ආකාරයේ අයුතු සැලකිලි පිළිබඳ චෝදනා විමර්ශනය කිරීම සඳහා වන ව්‍යවස්ථාපිත වගකීම ඉටු කිරීම සඳහා, ඕනෑම වේලාවක රැඳවුම් ස්ථානවලට පූර්ව දැනුම් දීමකින් තොරව පරීක්ෂණ සිදු කිරීම සඳහා කොමිෂන් සභාවට ඇති හැකියාව තීරණාත්මක බව අවධාරණය කෙරේ. කෙසේ වෙතත් 2026 ජූලි 7 වන දින කොමිෂන් සභාවට වැලිකඩ බන්ධනාගාරයට පිවිසීම ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ තත්ත්වයන් පිළිබඳව විමසීම සඳහා කොමිෂන් සභාව හමුවට බන්ධනාගාර කොමසාරිස් ජනරාල් (රාජකාරි ආවරණය කරන) සහ වැලිකඩ බන්ධනාගාරයේ ප්‍රධාන ජේලර්වරයා කැඳවා ඇත.

තම අඛණ්ඩ විමර්ශනයේ ප්‍රගතිය වරින් වර ප්‍රකාශ මගින් මහජනතාවට පැහැදිලි කිරීමට ද කොමිෂන් සභාව කටයුතු කරනු ඇති අතර, එවැනි ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශ නිවැරදිව හා වගකීමෙන් යුතුව සියලුම මාධ්‍ය ආයතන විසින් වාර්තා කරනු ඇතැයි ද කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

නිහාල් චන්ද්‍රසිරි

මාධ්‍ය ප්‍රකාශක/අධ්‍යක්ෂ - පර්යේෂණ හා අධීක්ෂණ අංශය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

10.07.2026

දුරකථන අංකය : 011 2505595

විද්‍යුත් තැපැල් ලිපිනය : rm.director.hrcsl@gmail.com